**වැලිකන්ද ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වැලිකන්ද ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වැලිකන්ද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු

කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ** වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

සියලුම ගිණුම්කරණ අඩුපාඩු මෙම මාතෘකාව යටතේ දැක්විය හැක. උදා: අඩුවෙන් දැක්වීම්, වැඩියෙන් දැක්වීම්, අත්හැරීම් ආදිය.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ ගොඩනැගිලි ක්ෂය වටිනාකම රු.14,464,174ක්, ගිණුම්ගත කිරීමේදී රු.9,812,308 ක් ලෙස දැක්වීම නිසාසමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා ගොඩනැගිලිවල ශුද්ධ පොත් අගය රු.4,651,866 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයට නිවැරදි කර ගිණුම්ගත කර ඇති බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ පරිගණක හා උපාංග වල ක්ෂය වටිනාකම රු.761,998 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.509,731 ක් ලෙස රු.252,267 කින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කර ගිණුම්ගත කර ඇති බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | පිබිදෙමු පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන යටතේ 2019/2020 වර්ෂ වලදී ඉදිකිරීම් නිමකරන ලද ගොඩනැගිලි 03 ක වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම් ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව | වත්කම්වල වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | කර්මාන්ත ණයගැති ශේෂය රු.920,520 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇති බව | නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද වත්කම් විෂයයන් 02 ක වටිනාකම ඒවාට අදාළ මූල්‍ය ප්‍රකාශන හා උපයෝගී ලේඛන අනුව රු.608,992 ක නොසැසඳීමක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදිව සැසඳීම් කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| කර්මාන්ත ණයගැති ශේෂය | 44,802,479 | ශේෂ සනාථ කිරීම් | ඉදිරියේදී එම ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | ශේෂ සනාථ කිරීම් හා උපලේඛන නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |
| කර්මාන්ත ණයහිමි ශේෂය | 45,379,043 | ණයගැති ණයහිමි සැසදීම් | | |
| වැලි තොටුපල ආදායම | 83,100 | ආදායම් ලේඛන | | |
| ආපසු ගෙවිය යුතු තැන්පත් | 41,500 | උපලේඛනය, යාවත්කාලීන කරන ලද තැන්පතු ලේඛනය | තැන්පත් මුදල් වසර දෙකකට වඩා වැඩි හෙයින් ආදායමට ගැනීමට කටයුතු කර ඇති බව | උපලේඛන නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පනත්<br>-------- | | | |
| (i) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත<br>------------------- | | | |
| | 219(1) වගන්තිය | ප්‍රාදේශීය සභාව සතු වැලිකන්ද නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 07 ක් හා බස්නැවතුම්පොළ ඉහළ මහල කඩ කාමර 06 ක් සමාලෝචිත වර්ෂයේදී බදුදීමේදී කඩ කාමර 06 ක් සභාවට සම්බන්ධිත පාර්ශවයන් වෙත ලබාදී තිබුණි. | නියමිත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරමින් වත්කම ලබාදී ඇති බව හා මේ වන විට අදාළ කුලී නිසි පරිදි අයකරමින් පවතින බව | නීතිරීති වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>-------------- | | | |
| (i) | XXIV පරිච්ඡේදයේ 31 වගන්තිය | සභාවේ හිටපු ලේකම්වරයා විසින් මහා සභාවේ සම්මත වූ යෝජනාවක් ලෙස දක්වමින් සතිපොළ බදුදීම සම්බන්ධව කූට ලේඛන සකස් කර විගණනය වෙත ඉදිරිපත් | පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් මූලික | නීතිරීති වලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කරන ලද නමුත් මෙම විෂමාචාරය සම්බන්ධව විනයානුකූලව කටයුතු කර නොතිබුණි. | විමර්ශනයක් ආරම්භ කර ඇති බව | |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>----------------- | | | |
| මු.රෙ. 103 (1) | 2022 ඔක්තෝබර් අනාවරණය කරගන්නා ලද ආදායම් පරීක්ෂකවරයාගේ මුදල් වංචාව සම්බන්ධයෙන් පොලිසියට වාර්තා කිරීම, නැතිවීම් හානිවීම් ලේඛනයෙහි ඒ අලාභය පිළිබඳ සටහන් කිරීම, එක් එක් නිලධාරියාට විරුද්ධව වෙන් වෙන් වශයෙන් පියවර ගැනීම සිදුකර නොතිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් මූලික විමර්ශනයක් ආරම්භ කර ඇති බවත්, විමර්ශනයේ වාර්තාව ලැබීමෙන් පසු ඒ අනුව කටයුතු සිදුකරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අයහාරය ඉක්ම වූ වියදම රු.17,020,208 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අයහාරය ඉක්ම වූ වියදම රු.6,647,841 ක් විය.

සටහන : රු. 11,018,800 ක උසාවි දඩ ආදායම් තොරතුරු විගණිත දිනට පසුව හඳුනාගෙන තිබුණු බැවින් අයහාරයට ඇතුළත්ව නොමැත.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,335,500 | 1,453,305 | 1,340,835 | 130,720 | 787,400 | 389,400 | 389,400 | - |
| (ii) | කුලී | 6,298,283 | 6,081,568 | 6,592,378 | 4,061,392 | 8,558,916 | 4,284,700 | 2,534,125 | 5,478,753 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 579,750 | 151,718 | 140,348 | 786,015 | 488,650 | 189,282 | 189,281 | 774,845 |
| (iv) | වෙනත් ආදායම් | 11,500,000 | 5,847,550 | - | 17,882,951 | 8,544,000 | 11,0 74,183 | 9,300,000 | 12,035,401 |
| | | 19,713,533 | 13,534,141 | 8,073,561 | 22,861,078 | 18,378,966 | 15,937,565 | 12,415,806 | 18,288,999 |

**2.3.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත කසළ බදු ආදායම රු.672,000 ක් හා ආරම්භක හිඟය රු.303,200 කින් වර්ෂයේදී රැස්කර තිබූ ආදායම රු.477,748 ක් විය. | හිඟ කසල බදු වසර ගණනාවක සිට පැවත එන අතර එම හිඟ මුදල් කපාහැරීමට ආණ්ඩුකාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමින් පවතින බව | නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත කඩ කුලී ආදායම රු.2,109,948 ක් හා ආරම්භක හිඟය රු.3,334,472 ක් වශයෙන් රැස්කිරීමට අපේක්ෂා කර තිබූ රු.5,443,720 ක ආදායමින් සමාලෝචිත වර්ෂයේදී රැස්කර තිබූ ආදායම රු.1,519,029 ක් එනම් සියයට 28 ක ප්‍රතිශතයක් වී තිබුණි. | නිරවුල් කරගැනීමට කටයුතු කරන බව | නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | කඩ කාමර බදුදීමට අදාළ ගිවිසුම අනුව බදුකුලී මුදල් ගෙවීම පැහැර හරින අවස්ථාවකදී ගිවිසුම අවලංගු කිරීමේ හා බදු දේපලෙන් බදු ගැනුම්කරු ඉවත් කිරීමේ අයිතිය බදු දීමනාකාර පාර්ශවය සතු වුවත්, කඩකාමර 53 කට අදාළ රු.3,227,687 ක හිඟ බදු කුලී සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිරවුල් කරගැනීමට කටයුතු කරන බව | නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | වාර්ෂික ටෙන්ඩර් මත බදුදෙන දේපළවලට අදාළව සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.923,654 ක හිඟයක් පවතින අතර, එම හිඟය 2021 සහ 2022 වර්ෂයන්වලට අදාළ වන නමුත් නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කරගැනීමට කටයුතු කරන බව | නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | **බලපත්‍ර ගාස්තු** | | |
| | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.916,735 ක හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු ආදායමක් පැවතුණි. | හිඟ බලපත්‍ර ගාස්තු වසර ගණනාවක සිට පැවත එන අතර එම හිඟ මුදල් කපාහැරීමට ආණ්ඩුකාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමින් පවතින බව | හිඟ ආදායම් නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | **වෙනත් ආදායම්**<br>පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.13,706,950 ක් හා මුද්දර ගාස්තු රු.4,176,000 ක් විය. | ඉදිරියේදී ඒ පිළිබඳව නිවැරදි තොරතුරු ලද විට ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | නිවැරදි ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ)** | | **අතුරු ව්‍යවස්ථා** | | |
| | (i) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු ගොඩනැගිලි තැනීම, පාරවල් සහ මංමාවත්, කුණු කසළ ඉවත්කිරීම, විනෝද බදු, වැලි ප්‍රවාහන යන ප්‍රධාන කාර්යයන් 06 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සැකසීමට ඉදිරියේදී කටයුතු කකරන බව | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| | (ii) | සභාව විසින් පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ප්‍රධාන ක්‍රියාකාරකම් 17 ක් සඳහා අපේක්ෂිත වියදම රු.116,100,000 ක් වුවද, වාර්ෂික අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන වියදම් වෙන්කර ඇති මුදල රු.2,000,000 ක් වූයෙන් ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සැලසී නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරගැනීමට කටයුතු කරන බව | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් ඉටුකරගැනීම සඳහා අයවැය මඟින් ප්‍රතිපාදන සැලසිය යුතුය. |
| | (iii) | සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් 17 ක් දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ක්‍රියාකාරකමක් ඉටුකිරීමට අපොහොසත් වී තිබුණි. | ඉදිරි වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්මට අදාළ ක්‍රියාකාරකම් ඉටුකිරීමට කටයුතු කරන බව | නිවැරදිව ක්‍රියාකාරකම් සැලසුම් කළ යුතුය. |
| | (iv) | සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ මානව සම්පත් සංවර්ධන සඳහා වැඩමුළු 04 ක් සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එක් වැඩමුළුවක් හෝ ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම වර්ෂයේදී අදාළ වැඩමුළු කටයුතු සැලසුම් කරමින් පවතින බව | සැලසුම් කළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | | |
| (i) | වැලිකන්ද ප්‍රාදේශීය සභාව විසින් සභා බල ප්‍රදේශයේ දෛනිකව ජනනය වන කසළ කළමනාකරණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, වර්ගීකරණයකින් තොරව රැස්කරනු ලබන කසළ සේනපුර කොට්ඨාශයට අයත් ඇතුගල අක්කර 05 ක පමණ විවෘත භූමියකට බැහැර කර වසා දැමීම තවදුරටත් ක්‍රියාත්මක කරමින් පැවතුණි | පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් හා උසාවි දඩ මුදල් මඟින් කසල කළමනාකරණය කිරීම සඳහා ගබඩාවක් ඉදිකිරීමට මුදල් වෙන්කර ඇති බැවින් ඉදිරියේදී නොදිරන කසල එම ගබඩාවේ එකතු කිරීම මඟින් අලෙවි කිරීමට කටයුතු කරන අතර දිරන කසල ද කොම්පෝස්ට් පොහොර සාදා අලෙවි කිරීමට කටයුතු කරන බව | විධිමත් පරිදි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කළ යුතුය. |
| (ii) | 2021 වර්ෂයේදී නෙළුම්වැව ප්‍රදේශයේ රු.1,236,921 ක් වැයකර ඉදිකරන ලද නොදිරන කසළ අලෙවි ගබඩාව දිගින් දිගටම නිෂ්කාර්යව පැවතුණි. | එවකට සිටි මහජන නියෝජිතයන්ගේ යෝජනාවකට අනුව එම ගොඩනැගිල්ල ඉදිකර ඇති නමුත්, එම ගොඩනැගිල්ල සඳහා දෛනිකව කසල ප්‍රවාහන වියදම වැඩි නිසා ගොඩනැගිල්ල භාවිතා කිරීම ගැටළුවක් බව | වත්කම් ස්ථාපනයේදී ශක්‍යතා අධ්‍යනයක් සිදුකළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.254,489 ක ණයගැති ශේෂයක් වසර ගණනාවක සිට නිරවුල් නොකර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පැවතුණි. | ණයගැති ශේෂය මෙම වසර තුළ නිරවුල් කරගැනීමට කටයුතු කරන බව | ගිණුම් නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළ ග්‍රාමීය විද්‍යුත් පුස්තකාල ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද පුස්තකාල 02 ක වැඩ අවසන් කර ඇතත්, ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත් නොමැතිවීම හේතුවෙන් එම පුස්තකාල නිෂ්ක්‍රීයව පැවතුණි. | පුස්තකාලයක් ලෙස ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය බඳවාගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීම සඳහා යවා ඇති බව නෙළුම්වැව පාසල ඉදිරිපිට භූමියෙහි ග්‍රාමීය විද්‍යුත් පුස්තකාලය පාසල ආසන්නයේ පිහිටා ඇති බැවින් ලිපිද්‍රව්‍ය අලෙවි සැලක් සඳහා ලබාදීමට කටයුතු කරමින් පවතින බව | වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද වැලිකන්ද නව වෙළඳ සංකීර්ණයේ කඩකාමර 07 න් කඩකාමර 04 ක් අදාළ අරමුණු ඉටුවීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | වැලිකන්ද නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 03 ක් විවෘත කර ඇති අතර, ඉතිරි කඩ කාමර 04 ඉදිරියේදී විවෘත කිරීමට කටයුතු සිදුකරන බව | වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | රු.1,307,880 ක වියදමක් දරා ඉදිකරන ලද වැලිකන්ද සතිපොළ මාළු කඩ 04 ක් 2017 වර්ෂයේ සිට භාවිතා නොකර නිෂ්ක්‍රීයව පැවතුණි. | කඩ ඉදිරියෙන් රෙදි විකිණීම් කටයුතු සිදුකරන බැවින් මාළු කඩ ක්‍රියාත්මක නොවේ. මාළු කඩ දෙකක් වෙනුවට වෙනත් ව්‍යාපාරික කටයුත්තක් සඳහා ඉල්ලීම් කරන ව්‍යාපාරිකයන්ගේ ඉල්ලීම සලකා බලා ලබාදීමට කටයුතු කරන බව | වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | පිබිදෙමු පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන යටතේ 2019 වර්ෂයේදී රු.2,000,000 ක් වැය කර සංවර්ධනය කර සභාව වෙත ලබාදී තිබූ ප්‍රාදේශීය සභාවේ සංචාරක බංගලාව විගණිත දින දක්වාත් නිෂ්ක්‍රීයව පැවතුණි. | තක්සේරු වාර්තාව ලැබීමෙන් පසු ආයතනයකට බදු පදනම මත ලබාදීමට කටයුතු කරන බව දන්වා ඇත. | වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැලිකන්ද ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයේ අයවැය යෝජනා අනුව 2021/2022 වර්ෂවලදී ක්‍රියාත්මක වූ ව්‍යාපෘති වලින් රු.33,247,820 ක වටිනා ව්‍යාපෘති 13 ක් වැඩ අවසන් නොකර පැවතුණි. | 2024 වර්ෂයේ වාර්ෂික සංවර්ධන සැලැස්ම සඳහා යෝජනා ලබාදීමේදී මෙම ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබාදී ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට සැලසුම් කර ඇති බව දන්වා ඇත. | ව්‍යාපෘති වල වැඩ අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩල තොරතුරු අනුව කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 13 ක් පැවතුණි. | ඉහළ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව | පුරප්පාඩු සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රාජ්‍ය සේවා ස්ථාන මාරුවීම් අනුව වසර 05 කට වරක් ස්ථාන මාරුවීම් සිදුකළ යුතු වුවත්, සභාවේ කාර්ය | ඉහළ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇතත්, මේ වන විටත් | ස්ථාන මාරු සිදුකළ යුතුය. |

මණ්ඩලයේ නිලධාරීන් 29 ක් වසර 05 කට වඩා වැඩි විසඳුම් ලබාදී නොමැති කාලයක් සභාවේ සේවය කරන බව නිරීක්ෂණය විය. බව

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| NCP/LG/ACC02/01 හා 2023-01-02 දින විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛය අනුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සෑම කාර්තුවකට වරක්ම පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු 01 ක් පමණක් පවත්වා තිබුණි. | වර්තමානය වන විට විගණන හා කළමනාකරණ කමිටු පවත්වනු ලබන බව | නියමිත පරිදි විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. |